Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ව්‍යවසායකත්ව අධ්‍යයනය

සතිය- 05

10 ශ්‍රේණිය

සැකසුම - බී.ඩී.එම්.ආර්.සී.ඉන්දික බඹරගම

**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** -ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි.
ව්‍යවසායකයින්ගේ සුවිශේෂ ගතිලක්ෂණ විමර්ෂණය කරයි.

( පෙළ පොතේ පිටු අංක 19 සිට 24 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)

(01) ව්‍යවසායකයකු සතු මූලික ගති ලක්ෂණයක් ලෙස ' ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට විශ්වාසය' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

(02) තෝමස් අල්වා එඩිසන් විසින් විදුලි බුබුල පළමු වරට නිෂ්පාදනය කිරීමට යාමේදී අවස්ථා 999 ක් උත්සාහ කිරීමෙන් ප්‍රකටවන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය දක්වා එම ලක්ෂණය කෙටියෙන් පැහැදිලි කරන්න.

(03) අන් අදහස් ගරු කළද තීරණ ගැනීමේ දී නිදහස්ව සිතීමට ක්‍රියා කිරීම ස්වාධීනත්වයයි. ව්‍යවසායකයකුට ස්වාධීනත්වය වැදගත්වන්නේ ඇයි ?

(04) නම්‍යශීලීත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(05) ව්‍යවසායකයකු සතු පොදුවේ දැකිය හැකි ගති ලක්ෂණ 05 ක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

(06) ව්‍යවසායකයකු සතු පහත ගති ලක්ෂණ, මූලික ගතිලක්ෂණ සහ පොදු ගතිලක්ෂණ ලෙස වර්ග කරන්න.

| මූලික ගතිලක්ෂණ | පොදු ගතිලක්ෂණ |
|---|---|
| | |

නිර්මාණශීලීත්වය ,කැපවීම ,සාමාන්‍ය වැටහීම ,සුභවාදී බව , නම්‍යශීලීත්වය, ස්වයං පෙළඹවීම , ස්වාධීනත්වය ,ආත්ම විශ්වාසය ,අනාගත දැක්ම , දැඩි ආශාව , අවදානම් බාර ගැනීම

(07) දී ඇති පැහැදිලි කිරීමට වඩාත් උචිත ව්‍යවසායකත්ව ගති ලක්ෂණය දක්වන්න.

i. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවා විසඳීමට නව අදහස් සහ ක්‍රියාමාර්ග ගැනීම.

ii. පරිසරයේ වෙනස්වීම් කල්ඇතිව තේරුම්ගෙන ව්‍යාපාරයක් බවට පත්කර ගැනීම.

iii. අනෙකුත් අයගේ අදහස් ගරුකරන නමුත් සැමවිටම නිදහස් අදහස් දැරීම.

iv. පුද්ගලයාගේ නිර්මාණශීලී අදහස් ප්‍රයෝජනවත් දෙයකට යෙදවීම.

v. අනාගතයේදී සාර්ථක කර ගැනීමට වෙර දරන සිහිනයයි.

**(පෙළපොත පිටු අංක 23 , ක්‍රියාකාරකම් 08 සම්පූර්ණ කරන්න)**